

# පුරා විද්‍යාව යනු කුමක් ද?


පුරා විද්‍යාව යනු ඓතිහාසික හා සමාජ විද්‍යා යන පුළුල් විෂය ක්ෂේත්‍රයට අයත් අධ්‍යයන අංශයකි. පුරාතන සමාජයන්ගෙන් ඉතිරිවී ඇති භෞතික ද්‍රව්‍යයන් එක් රැස්කොට අධ්‍යනය කරමින් ඒ පිළිබඳ දැණුම වර්ධනය කර ගැනීම පුරා විද්‍යාවේ ප්‍රධානතම පරමාර්ථයයි. ප්‍රාග් ඓතිහාසික හා ඓතිහාසික යුගයන්ට අයත් අවශේෂයන් පිළිබඳ අධ්‍යනය කිරීම මෙයට ඇතුළත් වේ. මිනිසා අතින් නිශ්පාදනය වූ විවිධ සංස්කෘතික ද්‍රව්‍යයනුත් අවි ආයුධ හා මෙවලම් පිළිබඳව හා ඒවා නිෂ්පාදනයට දක්වන දැණුමත්, සමාජ දේශපාලනය, අධ්‍යාපන හා පරිපාලන සම්බන්ධතා වාණිජ සම්බන්ධතා මෙන් සිරිත් විරිත් ආදියත් දර්ශන, විශ්වාස ආගම් සහ ඇදහිලි ක්‍රම ආදිය පිළිබඳවත් දැන ගැනීමට උපකාරී වන විවිධ මාදිලියේ අවශේෂයන් අධ්‍යයනය කිරීමත් පැරණි මිනිසා පිළිබඳ දැණුම වර්ධනය කර ගැනීමත් පුරා විද්‍යාවේ අවශ්‍ය අංගයකි.

එමෙන් ම මනුෂ්‍ය බලපෑම පිළිබිඹුවන පුරාණ ස්වාභාවික ද්‍රව්‍යයන් අධ්‍යයන කිරීම ද මෙහි දී වැදගත් වේ. පරාග විශ්ලේෂණය මගින් එම ප්‍රදේශ වල පුරාණයේ වැවී තිබූ පැලෑටි පිළිබඳව නිගමනයක් කළ හැක. එයින් පරිසරය හා මිනිසා අතර තිබූ සම්බන්ධය තීරණය කිරීම පහසු ය. මෙසේ ස්වාභාවික ද්‍රව්‍ය වල දක්නට ලැබෙන මනුෂ්‍ය ජීවිතයේ අංශ ecofacts එකොපැක්ට්ස් නමින් පුරාවිද්‍යාවේදී හැඳින් වේ.

පුරාවිද්‍යාව යනු කුමක්ද යන්න පිළිබඳව විවිධ මත ඉදිරිපත් වී තිබේ. ඉංග්‍රීසි ජාතික ෆ්‍රැන්සිස් බේකන් නමැති විද්‍යාඥයා ප්‍රකාශ කරන්නේ , "පුරාවස්තු යනු විරූපි වූ ඉතිහාසය" නැතහොත් කාලයාගේ ඇවෑමෙන් ඉතිරි වූ සුනුබුන් ය යනුවෙනි. අර්නස් ඇල්ෆ්‍රඩ් හූටන් ප්‍රකාශ කර ඇත්තේ පුරාවිද්‍යාවෙන් හැඳින්වෙන්නේ "යල් පැනගිය පැරණි බඩු මුට්ටු පිළිබඳ සැලකිල්ලක් " බවයි.

"අතීතය නැවත ගොඩනැගීම සඳහා ක්‍රමානුකූලව පුරාවස්තු අධ්‍යයනය කිරීම පුරාවිද්‍යාවයි" යනුවෙන් 1939 ග්‍රැහැම් ක්ලාක් විද්‍යාත්මක අයුරින් ඉතා කෙටියෙන් පුරාවිද්‍යාව හඳුන්වා දෙයි.

ස්ටුවට් පිගොට් නමැති පුරාවිද්‍යා ඉතිහාසඥයා ඉදිරිපත් කරන මතය පුරාවිද්‍යාව පිළිබඳ මතවලින් ඉදිරියෙන්ම ඇති මතයකි. ඔහු ප්‍රකාශ කරන්නේ "පුරාවිද්‍යාව ඉතිහාසයේ ශාඛාවකි. පුරාවිද්‍යාව අධ්‍යනය කිරීමත් ඊට සේවය කරන විධි නියමත් එමෙන් ම ශල්ප ක්‍රමත් පිළිබඳ අවුලක් ඇතිවී තිබේ. මෙය අරමුණ හා ඊට ළඟාවන මාර්ග පටලවා ගැනීමකි. අතීතයෙන් බේරී එන ද්‍රව්‍යාත්මක සාක්ෂ්‍ය නැතහොත් නැසීගිය සමාජවල ඉතිරිව ඇති භාණ්ඩ සහ ජයග්‍රහණ අධ්‍යයනය කිරීමේ ශිෂ්‍යයෝ පුරාවිද්‍යාඥයෝ ය." මෙහිදි පුරාවිද්‍යාව යනු කුමක් ද යන්න පිළිබඳ තරමක විග්‍රහයක් කර ඇත.



ලංකාවේ ප්‍රථම පුරාවිද්‍යා කොමසාරිස් එච්. සී. පී. බෙල් මහතා

පුරාවිද්‍යාව පිළිබඳ විද්‍යාත්මක අදහසක් ඉදිරිපත් කොට ඇත්තේ ගිදිරි නම්, ආසියාතික ඉතිහාසඥයාය.


ඓතිහාසික යන පළල් ක්ෂේත්‍රයට ඇතුළත් භාවිතාත්මක හා න්‍යායාත්මක විද්‍යාවෙකි පුරාවිද්‍යාව; එහි ප්‍රධාන කාර්ය වන්නේ අතීත සමාජවලට අයත් ඉතිරිව ඇති සෑම ද්‍රව්‍යයක්ම රැස් කිරීම, පරීක්ෂා කිරීම සහ අර්ථ නිරූපනය කිරීම මගින් අතීතය පිළිබඳ අපේ අවබෝධය ඉදිරියට ගෙනයෑමයි. යනු ඔහු ඉදිරිපත් කළ මතයයි.

මේ හැර බෙල්ජියම් ජාතික පුරාවිද්‍යාඥයකු වූ සිග්ෆ්‍රඩ් ද ලයට් නම් තැනැත්තාත් රොබට් ජේ බ්‍රේඩ්වවුඩ් නැමැත්තාත් මේ පිළිබඳව අදහස් දක්වා ඇත.

ඇතැම් පුරාවිද්‍යාඥයින් එකිනෙකින් වෙනස් වූ විශිෂ්ඨ පුරාවිද්‍යා ක්ෂේත්‍ර දෙකක් ගැන සඳහන් කරයි. ඉතාලියෙන් යුරෝපයේ අනෙක් රටවලට 15 වන සියවසේදී පමණ විහිදී ගිය පුනරුදයේ දි පළමුවෙන් පුරාවිද්‍යාව නැගී ආවේ ය.

බුද්ධිමතුන්ගේ කලා පුනරුදය මතු වූයේ නවීන අවබෝධ සමග අත්වැල් බැඳ ගෙන ය. මෙම සියුම් කලා පුරාවිද්‍යා ක්ෂේත්‍රයට අයත් වූයේ චිත්‍ර කලා මූර්ති සහ ගොඩනැගිලි ආදිය යි. විකල්ප පුරාවිද්‍යාව පසුගිය අවුරුදු සියය තුළ ඇති වූ බව සැළකේ.

එංගලන්තයේ ගල් ආයුධ සහ අනෙකුත් පුරාවිද්‍යාත්මක ස්ථරයන් තිබූ ස්ථාන සොයාගත් ජෝන් ෆ්‍රෙර් නමැත්තා පුරාවිද්‍යාවේ වැදගත්කම හා ඒ පිළිබඳ නිර්වචනයක් ඉදිරිපත් කළත් එකල තිබූ අදහස් නිසා එය යටපත් වී නැවත අවුරුදු ගණනකට පසු ඉස්මතු විය.




ක්‍රි. පූ. 4 වන සියවසේ බ්‍රාහ්මී අක්ෂර



ක්‍රි. ව. 14 සියවස – යාපහුව විසිතුරු දෙරටුව

යුරෝපයේ අන් රටවල පුරාවිද්‍යාව පිළිබඳව ඇල්මක් ඇතිවීමට පෙර ස්කැන්ඩිනේවියානු රටවල ඒ පිළිබඳ දැනුමක් ලැබූ අය වූහ. යුග තුනේ ක්‍රමය පිළිබඳව, වැටහීමක් ලබාදුන් තොම්සන් සහ වෝර්සායි ද පුරාවිද්‍යාව සකස් විය යුතු ආකාරය පෙන්වා දුන් අය අතර ප්‍රධාන වූහ. ඔවුන් අනුගමනය කළ ක්‍රියාමාර්ග අනුව පුරාවිද්‍යාව යයි හැඳින්වූයේ අතීත මිනිසාගේ ජීවන රටාව දැනගැනීම යයි කිව හැකි ය.

චාල්ස් ඩාවින් 1859 දී ලියූ සත්ව සම්භවය සහ චාල්ස්ලයල් ගේ මිනිසාගේ පෞරාණිකත්වය නමැති කෘති දෙක බිහිවීමෙන් පසුව පුරාවිද්‍යාව බොහෝ දුරට නවීන අයුරින් පෝෂණය වන්නට විය. ලූවිස් හෙන්රි මෝගන් සහ ඊ. බී. ටයිරේ යන සමාජ හා මානව විද්‍යාඥයින් දෙදෙනා විකල්ප පුරාවිද්‍යාව විශේෂත්වයක් ලබාදුන්හ.

එලින්බර්ස් පෙට්‍රි සහ පිට්රිවස් සම්භාවනීය ක්ෂේත්‍ර පුරාවිද්‍යාඥයින් දෙදෙනෙකි. පිට්රිවස් ස්ථරයන් අනුව කැණීමේ වැදගත්කම පෙන්වා දුන්නේ ය. ඔවුන් පුරාවිද්‍යා කැණීම් සඳහා අනුගමනය කළ දෙයින් ඔවුන් පුරාවිද්‍යාව යයි සැලකූ දෙය ඉතාම පැහැදිලි ය.

පුරාවිද්‍යාව පිළිබඳ නවීන විද්‍යාඥයින් ඉදිරිපත් කර ඇති මත පිළිබඳව අවධානය යොමුකිරීම ද මෙහිදී වැදගත් වේ. ඒ අනුව පුරාවිද්‍යාත්මක ක්‍රියාමාර්ගය කොටස් පහක් ලෙස පැහැදිලි කළ හැකි ය.

1. ගවේෂණය සහ මූලික හඳුනා ගැනීම
2. දත්ත එක්රැස් කිරීම (කැණීම් වලින්)
3. දත්ත පරීක්ෂා කිරීම සහ දත්ත විග්‍රහ කිරීම
4. දත්ත වර්ග කිරීම හා;
5. දත්ත අර්ථ නිරූපනය කිරීම

මේ අනුව පුරාවිද්‍යාඥයා අවශ්‍ය සියලු දේ එක්රැස් කර ගනී. මෙසේ එක් රැස් කර ගැනීම, පරීක්ෂා කිරීම, විග්‍රහ කිරීම, වර්ග කිරීම හා අර්ථ නිරූපනය කිරීම මගින් අතීත සමාජයේ පැවති අවධීම ඔවුනගේ සිතුම් පැතුම්, සිරිත් විරිත්, ඇඳුම් පැළඳුම් ආහාර පාන වර්ග හා භාවිත කළ භාණ්ඩ ආදිය පිළිබඳවත් පුළුල් අධ්‍යනයක් කළ හැකි ය.

මේ අන්දමින් අතීතය පිළිබඳව විස්තර සොයා එය වර්තමානය දක්වා විකාශනය වූ අයුරුත් එය අද පවත්නා ආකරයත් අවබෝධ කර ගත හැකි ය.

මේ මතවලින් ක්‍රමයෙන් පුරාවිද්‍යාව වර්ධනය වූ ආකාරයත් මිනිසාගේ දැනුම වැඩී ගිය ආකාරයත් පැහැදිලි ය.

# පුරා විද්‍යාව හා විද්‍යාව

පුරා විද්‍යාව හා විද්‍යා එකිනෙකට ඉතා කිට්ටු සම්බන්ධතාවක් දක්වන බව ද මෙහිදී සැලකිය යුත්තකි. නාණක (කාසි) විද්‍යාව, වාස්තු විද්‍යාව, අක්ෂර විද්‍යාව, භූ ගර්භ විද්‍යාව හා රසායන විද්‍යාව යන විද්‍යාවන් පුරාවිද්‍යා කටයුතු වලදී බොහෝ දුරට උපයෝගී වේ. පුරාවිද්‍යා කැණීම් වාර්තා කිරීම්, තහවුරු කිරීම් ආදී වැදගත් අවස්ථාවලදී බොහෝ විද්‍යාවන් උපයෝගී වේ. හමුවන පුරාවස්තු පරීක්ෂා කිරීම සඳහා විද්‍යාගාරවල සහයෝගය ද අවශ්‍ය වේ. පුරාවිද්‍යාව හා විද්‍යාව අතර පවතින සම්බන්ධය මේ අනුව පැහැදිලි වේ.

පුරාවිද්‍යාව හා ඉතිහාසය අතර පවතින සම්බන්ධය කුමක්ද යන්න මෙහි දී සැලකිය යුතු තවත් පැනයකි. පුරාවිද්‍යාව ඉතිහාසයේම ශාඛාවක් බව, ස්ටුවට් පිගොට් පෙන්වා දී ඇත. පුරාවිද්‍යාඥයා හා ඉතිහාසඥයා යන දෙදෙනාම පුරාතනය පිළිබඳව තොරතුරු සෙවීමට නැඹුරුවූවත් ඔවුන් අතර වෙනසක් දක්නට ලැබේ. ඉතිහාසඥයා ලිඛිත ඓතිහාසික තොරතුරු කෙරෙහි අවධානය යොමු කළත් පුරාවිද්‍යාඥයාගේ කාර්යය වන්නේ පුරාතනයේ ඉතිරි වී ඇති ද්‍රව්‍යයන් කෙරෙහි අවධානය යොමු කිරීමයි. අනෙක් අතට ලේඛනගත වාර්තාවලින් එහා ප්‍රාග් ඓතිහාසික යුගය හැදෑරීමට හැකිවන්නේ පුරාවිද්‍යා වෙති. ලිඛිත ඓතිහාසික වාර්තාවල සඳහන් කරුණු, ස්ඵුට කිරීමට හෝ ඒවා වැරදි බව පෙන්වීමට හෝ පුරාවිද්‍යාවෙන් ලැබෙන පිටුවහල අපමණ ය. තවත් කරුණක් වන්නේ ඉතිහාසය මගින් හෙළිකර ගැනීමට නොහැකි බොහෝ කරුණු පුරාවිද්‍යාව ආශ්‍රයෙන් හෙළිකර ගැනීමට හැකි වීමයි.

සංක්ෂිප්ත වශයෙන් දක්වන්නේ නම් පුරාවිද්‍යාවේ පරමාර්ථය අතීතයේ ජීවත් වූ මිනිසා විසින් ඉතිරිකොට දමා ඇති දැනට දිරාපත්ව ගිය හෝ යම්තම් ඉඟි වශයෙන් පවතින හෝඩුවාවන් උපයෝගීකොට ගෙන පුරාතන මිනිසාගේ ඉතිහාසය අනාවරණය කිරීම යි.